රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 1000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

**BCU 12513 - බෞද්ධ සංස්කෘතික සංකල්ප**

<u>**ප්‍රශ්න හතරකට (04)**</u> පමණක් පිළිතුරු සපයන්න.

කාලය **: පැය 03**

---

01. මානව සංහතියේ ඒකත්වය තහවුරු කිරීමට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ඉගැන්වීම් සමකාලීන භාරතයේ පැවති වර්ණ භේදය විවේචනයට ලක්කිරීමට හේතු වූ ආකාරය විමසන්න.

02. කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමෙහි ලා බුදු දහම මඟින් ලැබුණු පිටුබලය කාන්තා විමුක්තිය පිළබඳව බෞද්ධ ආකල්ප ඇසුරින් පැහැදිළි කරන්න.

03. ධනය ඉපැයීම හා පරිභෝජනය සඳහා බුදු දහම අනුදත් ක්‍රියාමාර්ගයන්හි උපයෝගීතාව ප්‍රකට කරන්න.

04. යුදගැටුම් ඇතිවීම වැළැක්වීමෙහි ලා බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ක්‍රියාමාර්ගයන් ලෝක සාමය පිණිස හේතු වන්නේදැයි විමසන්න.

05. ධාර්මික රාජ්‍ය පාලනය රටක සමෘද්ධිය පිණිස බලපාන ආකාරය බෞද්ධ උපදේශයන් ඇසුරෙන් පැහැදිළි කරන්න.

06. පුද්ගලයකුගේ දියුණුව පිණිස කළ්‍යාණ මිත්‍ර සම්පත්තිය ද හේතුවන බව බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සනාථ කරන්න.

07. නූතන කළමනාකරණ ක්ෂේත්‍රයට බුදු දහම මඟින් ලබා ගත හැකි උපදේශයන් කවරේදැයි විග්‍රහ කරන්න.

08. පුද්ගලයා හා විශ්වය දේව නිර්මාණයක් නොවන බව බෞද්ධ ඉගැන්වීම් මඟින් සනාථ වන්නේදැයි පරීක්ෂා කරන්න.

(එක් පිළිතුරකට ලකුණු 15 බැගිනි)

@@@@@@@@@@@@@@@@@@@